# අසප්පුරිස - වධුකා සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදි. එකල්හි භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුතුමා විසින් කරවන ලද ජේතවනාරාමයේ වැඩ වසන සේක. එදා භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි', කියා භික්ෂූන් වහන්සේලා අමතා වදාළ සේක. ඒ ස්වාමීන් වහන්සේලා ද 'සුගතයන් වහන්ස' යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. ඒ අවස්ථාවේ දී බුදු රජාණන් වහන්සේ මේ උතුම් දේශනය වදාළ සේක.

*මහණෙනි, කරුණු හතරකින් යුතු තැනැත්තා අසත්පුරුෂයෙක් බව දැනගත යුතු යි. ඒ කුමන කරුණු හතරක් ද යත්:*

- **මහණෙනි, මේ ලෝකයේ අසත්පුරුෂයා අනුන් ගේ යම් නුගුණක් ඇද්ද ඒ පිළිබඳ ව නො ඇසූවිට ත් ප්‍රකාශ කරයි. ඇසූවිට ප්‍රකාශ කිරීම ගැන කවර කථා ද. (අනුන් ගේ නුගුණ පිළිබඳ ව) විමසූ විට, ප්‍රශ්න ඇසූ විට, අඩුවක් නො කොට නො සඟවා පරිපූර්ණ ලෙස විස්තර වශයෙන් අනුන් ගේ නුගුණ කිය යි. මහණෙනි, මේ පුද්ගලයා අසත්පුරුෂයෙක් බව දැනගත යුතු යි.**

- **එසේ ම මහණෙනි, මේ ලෝකයේ අසත්පුරුෂයා අනුන් ගේ යම් ගුණයක් ඇද්ද ඒ පිළිබඳ ව, ඇසූවිට ත් ප්‍රකාශ නො කරයි. නො ඇසූවිට ප්‍රකාශ කිරීමක් ගැන කවර කථා ද. (අනුන් ගේ ගුණ පිළිබඳ ව) විමසූ විට, ප්‍රශ්න ඇසූ විට, අඩුකොට සඟවා අපරිපූර්ණ ලෙස විස්තර වලින් තොර ව අනුන් ගේ ගුණ කිය යි. මහණෙනි, මේ පුද්ගලයා අසත්පුරුෂයෙක් බව දැනගත යුතු යි.**

- **එසේ ම මහණෙනි, මේ ලෝකයේ අසත්පුරුෂයා තමන් ගේ යම් නුගුණක් ඇද්ද ඒ පිළිබඳ ව, ඇසූවිට ත් ප්‍රකාශ නො කරයි. නො ඇසූවිට ප්‍රකාශ කිරීමක් ගැන කවර කථා ද. (තමන් ගේ නුගුණ පිළිබඳව) විමසූ විට, ප්‍රශ්න ඇසූ විට, අඩුකොට සඟවා අපරිපූර්ණ ලෙස විස්තර වලින් තොර ව තමන් ගේ නුගුණ කිය යි. මහණෙනි, මේ පුද්ගලයා අසත්පුරුෂයෙක් බව දැනගත යුතු යි.**

- **එසේ ම මහණෙනි, මේ ලෝකයේ අසත්පුරුෂයා තමන් ගේ යම් ගුණයක් ඇද්ද ඒ පිළිබඳ ව නො ඇසූවිට ත් ප්‍රකාශ කරයි. ඇසූවිට ප්‍රකාශ කිරීම ගැන කවර කථා ද. (තමන් ගේ ගුණ පිළිබඳ ව) විමසූ විට, ප්‍රශ්න ඇසූ විට අඩුවක් නො කොට නො සඟවා පරිපූර්ණ ලෙස විස්තර සහිත ව තමන් ගේ ගුණ කිය යි. මහණෙනි, මේ පුද්ගලයා අසත්පුරුෂයෙක් බව දැනගත යුතු යි.**

*මහණෙනි, මේ කරුණු හතරින් යුක්ත වූ තැනැත්තා අසත්පුරුෂයෙක් බව දැන ගත යුතු යි.*

*මහණෙනි කරුණු හතරකින් යුතු තැනැත්තා සත්පුරුෂයෙක් බව දැන ගත යුතු යි. ඒ කුමන කරුණු හතරක් ද යත්:*

- **මහණෙනි, මේ ලෝකයේ සත්පුරුෂයා අනුන් ගේ යම් නුගුණක් ඇද්ද ඒ පිළිබඳ ව ඇසූවිට ත් ප්‍රකට නො කරයි. නො ඇසූවිට ප්‍රකාශ කිරීමක් ගැන කවර කථා ද. (අනුන් ගේ නුගුණ පිළිබඳ ව) විමසූ විට, ප්‍රශ්න ඇසූ විට අඩු කොට සඟවා අපරිපූර්ණ ලෙස විස්තර වලින් තොර ව අනුන් ගේ නුගුණ ප්‍රකාශ කරයි. මහණෙනි, මේ පුද්ගලයා සත්පුරුෂයෙක් බව දැනගත යුතු යි.**

- **එසේ ම මහණෙනි, මේ ලෝකයේ සත්පුරුෂයා අනුන් ගේ යම් ගුණයක් ඇද්ද ඒ පිළිබඳ ව නො ඇසූවිට ත් ප්‍රකාශ කරයි. ඇසූවිට ප්‍රකාශ කිරීම ගැන කවර කථා ද. (අනුන් ගේ ගුණ පිළිබඳ ව) විමසූ විට, ප්‍රශ්න ඇසූ විට අඩු නො කොට නො සඟවා පරිපූර්ණ ලෙස විස්තර වශයෙන් අනුන් ගේ ගුණ කිය යි. මහණෙනි, මේ පුද්ගලයා සත්පුරුෂයෙක් බව දැනගත යුතු යි.**

- **එසේ ම මහණෙනි, මේ ලෝකයේ සත්පුරුෂයා තමන් ගේ යම් නුගුණයක් ඇද්ද ඒ පිළිබඳ ව නො ඇසූවිට ත් ප්‍රකාශ කරයි. ඇසූවිට ප්‍රකාශ කිරීම ගැන කවර කථා ද. (තමන් ගේ නුගුණ පිළිබඳ ව) විමසූ විට, ප්‍රශ්න ඇසූ විට අඩුවක් නො කොට නො සඟවා පරිපූර්ණ ලෙස විස්තර සහිත ව තමන් ගේ නුගුණ කිය යි. මහණෙනි, මේ පුද්ගලයා සත්පුරුෂයෙක් බව දැනගත යුතු යි.**

- **එසේ ම මහණෙනි, මේ ලෝකයේ සත්පුරුෂයා තමන් ගේ යම් ගුණක් ඇද්ද ඒ පිළිබඳ ව ඇසූවිට ත් ප්‍රකාශ නො කරයි. නො ඇසූවිට ප්‍රකාශ කිරීම ගැන කවර කථා ද. (තමන් ගේ ගුණ පිළිබඳ ව) විමසූ විට, ප්‍රශ්න ඇසූ විට අඩුකොට සඟවා අපරිපූර්ණ ලෙස විස්තර වලින් තොර ව තමන් ගේ ගුණ කිය යි. මහණෙනි, මේ පුද්ගලයා සත්පුරුෂයෙක් බව දැනගත යුතු යි.**

*මහණෙනි, මේ කරුණු හතරින් යුතු පුද්ගලයා සත්පුරුෂයෙක් බව දැනගත යුතු යි.*

මහණෙනි, එක මේ වගේ දෙයක්. යම් රාත්‍රියක හෝ දහවල් කාලයක හෝ අලුත විවාහයට පත් වූ කාන්තාවක් නිවසට කැඳවාගෙන එයි ද, කැඳවාගෙන ආ අලුත ඇය තමන් ගේ නැන්දණිය

ගැන ත්, මාමණ්ඩිය ගැන ත්, ස්වාමි පුරුෂයා ගේ සොහොයුරා ගැන ත්, ස්වාමි පුරුෂයා ගැන ත්, අඩු ම වශයෙන් දැසි දස්සන්, වැඩකාරයන් ගැන ත් ගෞරවයෙන් යුතු දැඩි ලැජ්ජාවකින් හා බියකින් පසුවෙයි. නමුත් ඇය පසුකලක දී, එකට වාසය කිරීම නිසා, සමීප ඇසුර නිසා (එම විලි බිය නැති කොට ගෙන) නැන්දණියට ද, මාමණ්ඩියට ද, ස්වාමිපුරුෂයාට ද, මෙසේ කිය යි. "අහකට පලයල්ලා.. නුඹලා මොනවා ද දන්නේ.."

මහණෙනි, එසේ ම මේ සාසනයේ ඇතැම් භික්ෂුවක්, යම් ම රාත්‍රියක හෝ දහවල් කාලයක හෝ ගිහි ගෙදරින් නික්මී පැවිදි භාවයට පත් වෙයි ද, ඒ අවස්ථාවේ දී ඔහුට භික්ෂූන් වහන්සේලා ගැන ත්, භික්ෂුණීන් වහන්සේලා ගැන ත්, උපාසකයින් ගැන ත් උපාසිකාවන් ගැන ත් අඩුම තරමින් ආරාමයේ කටයුතු කරන අය ගැන ත්, සාමණේර ස්වාමීන් වහන්සේලා ගැන ත් දැඩි ගෞරවය මුසු ලැජ්ජාවක් හා බයක් පවතියි. නමුත් ඔහු පසු කලෙක දී එකට වාසය කිරීම නිසා, සමීප ඇසුර නිසා (එම ගෞරවයෙන් යුතු විලි බිය නැති කොට ගෙන) තමන් ගේ ආචාර්යයන් වහන්සේ ට ත් උපාධ්‍යායන් වහන්සේ ට ත් පවා මෙසේ කියයි. "ඉවතට යන්න, ඔබලා මොනවද දන්නේ..."

**එම නිසා මහණෙනි, ඔබලා විසින් මෙසේ හික්මිය යුතු යි. "අලුත ගෙනා මනමාලියක ගේ සිත බඳු (ගෞරවයෙන් යුතු විලි බිය සහිත) සිතකින් යුතු ව වාසය කරනවා" යනුවෙනු යි. මහණෙනි, ඔබලා විසින් හික්මිය යුත්තේ අන්න ඒ අයුරිනු යි.**

**සාදු ! සාදු !! සාදු !!!**



## DhammaMedicine

Namo Buddhaya !!!
This is the only path;
there is none other for
the purification of insight !

[Visit this Google Group]
[Click2Comment] | [Discussions] |



**Drink Dhamma medicine to get rid of all stresses**